# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
## பிரதான செயலாளர் அலுவலகம் - தென் மாகாணம்
## CHIEF SECRETARY'S OFFICE - SOUTHERN PROVINCE


| මගේ අංකය / எனது இல / My Ref. | CSS/7/1/9/2018 | ඔබේ අංකය / உனது இல / Your Ref. | | දිනය / திகதி / Date | 2018.05. 08 |
|---|---|---|---|---|---|

ප්‍රධාන ලේකම් උපදෙස් ලිපි (මුදල්) 07 - 2018

දකුණු පළාත් සභාවේ
සියළුම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් හා
ගණන්දීමේ නිලධාරීන් වෙත,

**<u>පළාත් සභා මුදල් රීති සංග්‍රහය අනුගමනය නොකිරීම</u>**

2007 දකුණු පළාත් සභා මුදල් රීති සංග්‍රහය 1987 අංක 42 දරණ පළාත් සභා පනතේ 19 (5) හා 20 (3) වගන්ති යටතේ බලාත්මක කර 2008.01.01 දින සිට දකුණු පළාත් සභාවේ සියළු ආයතනවලට අදාල වනසේ ක්‍රියාත්මක කර ඇත.

02. ඒ අනුව පළාත් සභාවේ සියළුම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, කාර්යාල, ආයතන, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ප්‍රඥප්ති මගින් පිහිටුවා ඇති එහෙත් මූල්‍ය රීති විධිමත්ව පනවා නොමැති අධිකාරි/ ව්‍යවස්ථාපිත ආයතනවල පළාත් සභා කාර්යයන් ඉටු කරන සියළුම නිලධාරීන් එම කාර්යයන් ඉටු කිරීමේදී පළාත් සභා මුදල් රීති අනුව කටයුතු කිරීමට බැඳී සිටී. එබැවින් සියළු පළාත් සභා නිලධාරීන් මුදල් රීති පිළිබඳව මනා අවබෝධයක් ලබාගත යුතු බවද, මුදල් රීති සංග්‍රහයේ සඳහන් කොට ඇත.

03. පළාත් රාජ්‍ය නිලධාරීන්ගේ කටයුතු නිරවද්‍යව හා නීත්‍යානුකූලව සිදු කරමින් අපේක්ෂිත කාර්යභාරය සඵලදායීව හා කාර්යක්ෂමව ඉටු කිරීම සඳහාද, උපරිම අවංකභාවයෙන් හා විනිවිදභාවයෙන් යුතුවීම සඳහාද පළාත් සභා මුදල් රීති අනුගමනය කිරීම අත්‍යාවශ්‍ය වේ.

04. එමනිසා පළාත් සභාවේ ආයතනයන්හි භාවිතය සඳහා මුද්‍රිත මුදල් රීති සංග්‍රහය ලබාදී ඇති අතර, සියළු පළාත් රාජ්‍ය නිලධාරීන්ට පරිශීලනය කලහැකි පරිදි ප්‍රධාන ලේකම් කාර්යාලයීය වෙබ් අඩවිය හරහා අන්තර්ජාලයටද නිකුත් කර ඇත.

05. එනමුත් පළාත් සභාවේ බොහෝ ආයතන විසින් පළාත් සභා මුදල් රීති සංග්‍රහය අනුගමනය නොකරන බව

- පළාත් භාණ්ඩාගාරයට ඉදිරිපත් කරනු ලබන වාර්තා
- විසර්ජන ගිණුම් හා ආදායම් ගිණුම්
- විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විගණන වාර්තා
- අභ්‍යන්තර විගණන වාර්තා

අනුව පැහැදිලි වේ. තවද පළාත් සභා රාජකාරි කටයුතුවලදී මුදල් රීති සංග්‍රහය නිසියාකාරව අනුගමනය නොකිරීම නිසා පළාත් සභාවේ බොහෝ ආයතනවල වැරදි, අඩුපාඩු, දුර්වලතා, වංචා,


ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary 091 2232343
කාර්යාලය / காரியாலயம் / Office 091 2234052, 091 2226118
ෆැක්ස් / பெக்ஸ் / Fax 091 2246299
විද්‍යුත් තැපැල / மின் அஞ்சல் / E-mail chiefsec1@sltnet.lk
වෙබ් අඩවිය / இ தளம் / Web site www.cs.sp.gov.lk

ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretary's Office, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.



"විශිෂ්ටත්වයෙන් ① ට එන යහපාලනයක්"

දූෂණ, මූල්‍ය අක්‍රමිකතා ආදිය පැන නැඟීමට හේතු වී ඇති බව විගණකාධිපති දෙපාර්තමේන්තුවේ හා අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ විගණන විමසුම් මඟින්ද නිරීක්ෂණය වේ.

06. එසේම මුදල් රීති සංග්‍රහයට අනුව කටයුතු කිරීම මඟින් පළාත් සභා ආයතනවලට ලැබෙන විගණන විමසුම් සංඛ්‍යාව අඩුකරගෙන, අවසන් විගණකාධිපති වාර්තාවට හා දකුණු පළාත් රාජ්‍ය අරමුදල් හා ගිණුම් පිළිබඳ කාරක සභාවට යොමුවන විගණන ඡේද ප්‍රමාණය අවම කර ගැනීමට ඉඩ ප්‍රස්ථාව සැලසෙනු ඇත.

07. එබැවින් දකුණු පළාත් සභා මුදල් රීති සංග්‍රහය හොඳින් අධ්‍යයනය කර, නිසි පරිදි අවබෝධ කරගෙන, එහි සඳහන් උපදෙස් තරයේ පිළිපදින ලෙස ඔබ අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව යටතේ ඇති ආයතනවල නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කරනලෙස කාරුණිකව දන්වමි.

08. 2008.01.01 දින සිට බලාත්මක කර ඇති මෙම පළාත් මුදල් රීති සංග්‍රහයේ සඳහන් මුදල් සීමාවන් හා රීති, එදිනට පසුව ගරු ආණ්ඩුකාරවර අනුමැතියෙන් නිකුත් කර ඇති ප්‍රධාන ලේකම් චක්‍රලේඛ හා උපදෙස් ලිපි මඟින් සංශෝධනය කර ඇති විට, එම සීමාවන් හා රීති පිළිපැදිය යුතු බවද වැඩිදුරටත් සඳහන් කරමි.

ආර්.සී. ද සොයිසා,
ප්‍රධාන ලේකම්,
දකුණු පළාත.

පිටපත් :

| | | | |
|---|---|---|---|
| 1. | සහකාර විගණකාධිපති, දකුණු පළාත | - | දැ.ගැ.ස. |
| 2. | විගණන අධිකාරි (ගාල්ල/ මාතර/ හම්බන්තොට) | - | දැ.ගැ.ස. |
| 3. | අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන) | - | දැ.ගැ.ස. |
| 4. | අධ්‍යක්ෂ (අයවැය/ ගිණුම් හා ගෙවීම්) | - | අ.ක.ස. |